*සැ. යු.* - 2011.08.05 දින පළ වූ අංක 1718 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,719 - 2011 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2011.08.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 956 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.*-- කාසිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011, ජූලි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අගෝස්තු මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## හබරාදූව ප්‍රාදේශීය සභාව

| *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. කාර්යාල කාර්ය සහායක | 02 | රු. 11,730-10x120-10x130-10x145-12 x 160-17,600 වැටුප් ඛණ්ඩය (P. L. I.) | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය සමත්වීම හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත්වී තිබීම, |
| 02. වෙළඳපොළ භාරකරු | 01 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-17,600 වැටුප් ඛණ්ඩය (P. L. I.) | අ. පො. ස. (සා. පෙළ) එකම වතාවකදී ම සිංහල හෝ දෙමළ භාෂාව සමඟ ගණිතය ඇතුළු විෂයන් 06ක් සමත්වී තිබීම හෝ දෙවරකට නොවැඩි වාරගණනකදී අ. පො. ස. සා. පෙළ විෂයන් සිංහල/දෙමළ භාෂාව/ගණිතය සමග විෂයන් 06ක් සමත්වී තිබීම. |

*වයස* :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අයවිය යුතුයි. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් හා කොන්දේසි* :

01. රජයේ හෝ රජයේ සංස්ථාවක සේවයේ සිට අකාර්යක්ෂමතාවය මත අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් ලෙස විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ විධිමත් විනය පරීක්ෂණයක් මත සේවයෙන් පහකර ඇත්තා වූ හෝ සිය තනතුර අතහැර ගියා වූ හෝ තැනැත්තෙක් නොවිය යුතුය.
02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදුකරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.
03. යම් අපරාධ නීති කෘත්‍යයක අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වගන්තිය ප්‍රකාරව අධිකරණයකදී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.
04. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. හබරාදූව බල ප්‍රදේශය තුළ අවුරුදු 05ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
05. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
06. හබරාදූව ප්‍රාදේශීය සභාවේ දැනට සේවය කරන අය සඳහා ප්‍රමුඛස්ථානය ලබාදෙනු ලැබේ.
07. මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කරනු ලැබේ.

*පොදු කොන්දේසි* :

01. තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.
02. බඳවා ගනු ලබන්නේ රජයේ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
03. ස්ථිරවීම වසර 03ක පරිවාස කාලයකට යටත් ය.
04. තනතුරේ ස්වභාවය අනුව ආයතනය මගින් අනෙකුත් සේවාවන්හි නියුක්ත කරවීමේ කොන්දේසි හා රාජකාරි වේලාවන් නියම කිරීමට යටත් වේ.
05. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති වලටද පළාත් පාලන සේවා දෙපාර්තමේන්තු රෙගුලාසි වලටද, හබරාදූව ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීතිවලට යටත් විය යුතුය.
06. හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
07. අවශ්‍ය වුවහොත් මුදලින් ඇපයක් තැබිය යුතුය.
08. මේ සම්බන්ධයෙන් කිසිම ලිපි ගණුදෙනුවක් නොකෙරෙන බව විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.
09. සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුය.
10. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

*අයදුම් කළයුතු ආකාරය* :

(අ) මෙම නිවේදනයේ පළ කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2011.08.26 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, ප්‍රාදේශීය සභාව, හබරාදූව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් ඒ - 4 ප්‍රමාණයේ කඩදාසි වල ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද වී හෝ උපදෙස්වලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*(ආ)* අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතු ය. මුල් සහතික එම අවස්ථාවේදී ඉදිරිපත් නොකිරීම හා ව්‍යාජ සහතික ඉදිරිපත් කිරීම නුසුදුසු කමක් සේ සළකනු ලැබේ.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික,
03. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය,
04. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතු ය),
05. සේවා සහතික (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට පමණි).

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ අතරතුර හෝ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල හබරාදූව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සතුය.

එසේම දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇතිවුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු ය.

දිල්ෂාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 21 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*හබරාදූව ප්‍රාදේශීය සභාවේ ............................................. තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. i. මුලකුරු සමඟ නම :————————.
ii. සම්පූර්ණ නම :————————.
02. ලිපිනය :————————.
03. උපන් දිනය :————————.
04. 2011.08.26 දිනට වයස :————————.
05. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන වග :————————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය)
06. විවාහකද/අවිවාහකද යන වග :————————.
07. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර :
i. තනතුරේ නම:————————.
ii. එයට පත්වූ දිනය:————————.
iii. පත්වීමේ ස්වභාවය (ස්ථිරද/අනියම්ද/තාවකාලිද):————————.
iv. මැතිවරණ කොට්ඨාසය:————————.
v. පළපුරුද්ද හා සේවා කාලය:————————.
08. අධ්‍යාපන සුදුසුකම්:————————.
(සාමාර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)
09. වෘත්තීය සුදුසුකම්:————————.
(තාක්ෂණික දැනුම පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)
10. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය:————————.
(ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

ඉහත සඳහන් අංක 01 සිට 10 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර, යම් විටකදී මේවා අසත්‍ය බව දැනගත් විටක මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා තේරුම් ගෙන ඇති බවටද සහතික කරමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................................................ මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

නම :————————.
තනතුර:————————.
දිනය:————————.

————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

08-242

## බෙන්තොට ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් පරිදි දකුණු පළාත් සභාව තුළ ස්ථිර පදිංචි පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. විස්තර පහත උපලේඛනයේ දැක්වේ.

*උපලේඛනය*

| *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. මුරකරු | 01 | රු.13,060 - 130 x 09 - 145 x 10 - 160 x 12 රු.17,600 (රා.ප.ච. අංක 06/2006-(iv) - PL-1- 2006 -A ) | යටත් පිරිසෙයින් 08 වන ශ්‍රේණිය හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත් වීම. |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි .-*

(i) අයදුම්කරුවෝ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය ;
(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ. (ආදේශක අනියම් තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනමට පත්වීම අවුරුදු 18-45 ක් අතර සිදුවිය යුතු ය.);
(iii) අයදුම්කරු දකුණු පළාත් තුල යටත් පිරිසෙයින් අවුරුදු 03 ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතු ය.);
(iv) බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ;
(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය;
(vii) බෙන්තොට ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ ;
(viii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

*03. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි -*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් අරමුදල් යටතේ දායක මුදල් ගෙවිය යුතු ය ;
(ii) පත්වීම දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ;
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද,/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද/ දකුණු පළාත් සභාව හෝ බෙන්තොට ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග අමතර ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
(iv) මෑතකදී ලබාගත් ග්‍රාමසේවා සහතිකයක් ඃ (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තිබිය යුතුය.) ;
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් .

*අයදුම්කළ යුතු ආකාරය .-*

මෙම් නිවේදනයේ දැක්වෙන ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පතක් සකස්කර 2011.08.25 වැනි දිනට පෙර "සභාපති, බෙන්තොට ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

ගයාන් සිරිමාන්න,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 21 වැනි දින,
බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම් පත්‍රය*

*බෙන්තොට ප්‍රාදේශීය සභාව*

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ................................. තනතුර සඳහා බඳවා ගැනීම*

1. මුලකුරු සමග නම :———————————.
   i. මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————————.
3. ස්ථිර ලිපිනය:———————————.
4. i. උපන් දිනය : අවුරුද්ද:———————————. මාසය:———————————.දිනය:———————————.
   ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු:———————————.මාස:———————————.දින:———————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය:———————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය:———————————.
7. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද?:———————————.
8. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාගය සඳහන් කරන්න):———————————.
9. වෘත්තීය සුදුසුකම්/සේවා පළපුරුද්ද:———————————.
10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?:———————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමටද යටත්වන බව දනිමි.

———————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:———————————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ආයතනයේ .......................... තනතුර දරන......................................... මයා/මෙනවියගේ අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

———————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

08-230

---

# පළාත් පාලන නිවේදන

## වඩමාරච්චි දකුණ/බටහිර ප්‍රාදේශීය සභාව කරවෙඩ්ඩි

1975 අංක 17 දරන පනතේ කම්ටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනයයි

පහත ශීර්ෂයේ සඳහන්කර ඇති පුද්ගලයින්ගේ ඉඩමේ ඔහුගේ ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති කම්ටුව 2011 වර්ෂයේ පවත්වාගෙන යාමට ඉහත අයිතිය ලබාදෙන පනතේ 06 වැනි වගන්තියට අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

එම අයිතිය ලබාදීමට යෝජනාකර ඇති කම්ටුව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අසළ පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළකරයි නම් ගැසට් නිවේදනය පළකර ඇති දින සිට සති හතරක් ඉක්මයාමට පෙර ලිඛිත පිටපත් දෙකකින් මා වෙත එවිය යුතු බව දන්වමි.

එස්. ජෙයවශීකරන්,
ලේකම්.

2011 ජූලි මස 20 වැනි දින.,
ජේදුරුතුඩුව,
පුලෝලි,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *කම්ටුවේ සභාපති ද, ලේකම් ද, කළමණාකරු ද යන වග* | *කම්ටුවේ නම* | *කම්ටුව පවත්වාගෙන යාමට සුදුසු යැයි යෝජනාකර ඇති ස්ථානය* |
|---|---|---|---|
| පොන්නයියා සෙල්ව ක්‍රිෂ්ණන්, පුලෝලි දකුණ, පුලෝලි | ලේකම් | පුලෝලි ක්‍රීඩා සමාජය | මන්දිහෙයි, පුලෝලි දකුණ, පුලෝලි |

08-244

## දඹුල්ල මහ නගර සභාව

### 2011 වර්ෂය සඳහා වැඩසටහන් අයවැය ලේඛනය

මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 212 (අ) වගන්තිය ප්‍රකාරව 2011 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් විස්තරය ඇතුළත් වැඩසටහන් අයවැය ලේඛනය 2011 ජූලි මස 29 වැනි දින සිට දින 07 ක කාලයක් මහජනයාට දැක බලා ගැනීම සඳහා මහනගර සභා කාර්යාලයේ තබා ඇති බව දැනුම් දෙමි.

එච්. එච්. ඒ. ඩී. ජේ. එච්. ඕපාත,
දඹුල්ල නගරාධිපති.

2011 ජූලි මස 20 වැනි දින,
දඹුල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

08-227

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය යටතේ ඉඩම් විකිණීම මත බදු අය කිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ පිහිටි ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ බ්‍රෝකර්කරුවකු විසින් හෝ ඔවුන්ගේ සේවකයා විසින් නැතහොත් නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත්, එම විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට එකක (1%) බද්දක්, 2011 වර්ෂයට පනවා අය කිරීමට තීරණය කර ඇති බවත්, මෙම බද්ද ගෙවීමට අදාළ ඉඩම් විකුණූ වර්ෂ අවසානයට පෙර අයවිය යුතු බවත්, මෙයින් දැනුම් දෙමි.

එස්. ඒ. ශ්‍රියානන්ද,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.
08-350/5

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 2011 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134(1) වගන්තිය ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇති ප්‍රදේශ තුළ පිහිටියා වූ සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් 5% (සියයට පහක්) ක දේපළ බද්දක් පිළිවෙලින් 2011.03.31, 2011.06.31,2011.09.31,2011.12.31 වැනි දිනයන් වලින් අවසන් වන කාර්තු හතරකින් අයකර ගැනීමටත්, නියමිත දිනට නොගෙවන වාණිජ දේපළවලින් 15%ක් ද, වාණිජ නොවන දේපළවලින් 10% ක්ද, වනසේ අධිගාස්තුවක් අයකර ගැනීමටත්, තීරණය කළ බව මහජනයා වෙත මෙයින් දන්වනු ලැබේ.

2011 ජනවාරි මාසයේ 31 වැනි දිනට පෙර වර්ෂයට අදාළ බදු මුදල ගෙවුවහොත් 10%ක වට්ටමක් ද, කාර්තුවකට අදාළ බදු මුදල එම කාර්තුවේ ප්‍රථම මාසයේ දී ගෙවුවහොත් 5%ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එස්. ඒ. ශ්‍රියානන්ද,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.
08-350/4

---

## පන්නල ප්‍රාදේශීය සභාව

### අරැපොල හත්තිනිය ගමේ හික්ගහමුලවත්ත (පන්නිරියගේ වත්ත) යෝජිත මුස්ලිම් පොදු සුසාන භූමිය ඉදිකිරීම සඳහා විරෝධතා කැඳවීම

පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇරැපොල ග්‍රාම නිලධාරි වසම තුළ පොදු සුසාන භූමියකට යාබදව පිහිටි හික්ගහමුලවත්ත හෙවත් පන්නරිය වත්ත නැමැති අංක 4775 දරන ඔප්පුවේ සඳහන් පර්චස් 20ක ඉඩම මුස්ලිම් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා පොදු සුසානභූමියක් ඉදිකිරීමට සලීමියාතුල් හසනියියා සංවිධානයේ ප්‍රධාන ලේකම්තුමා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බැවින් , 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි ආඥාපනතෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2010.07.27 වැනි දින රැස්වූ පන්නල ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් යෝජනා අංක 03/01 යටතේ යෝජනා සම්මත කර ඇත.

ඒ අනුව, ඉහත සුසානභූමිය ඉදිකිරීම සම්බන්ධ යම් විරෝධතාවක් ඇතොත් මෙම දැන්වීම පළ වූ දින සිට දින 30ක් දක්වා කාල සීමාව තුළ මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එම්. එස්. කේ. රංජිත් ලංසකාර,
සභාපති,
පන්නල ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 06 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

08-349

---

## මන්මුනේ ප්‍රාදේශීය සභාව - ආරයම්පදි

### ප්‍රාදේශීය සභා ආඥාපනත

### දේපළ බද්ද - 2010

ප්‍රාදේශීය සභා ආඥාපනතේ 134(1) වැනි පරිච්ඡේදයේ විධිවිධානයන්ට අනුව ඇති කරන ලද අතුරු විධානයන්හි නියෝගවලටත් සංශෝධනයන්ට අනුව මන්මුනේ ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ සියලුම කොට්ඨාසයන්හි පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපළවලටත් එකී වාර්ෂික වටිනාකමින් 05%ක දේපළ බද්ද පනවා අයකරනු ලබන බව මන්මුනේ ප්‍රාදේශීය සභා සභාපති වන මා මෙයින් සියලු දෙනාට දන්වා සිටිමි.

අදාළ ආඥාපනතේ 134(1) වගන්තියට අනුව අදාළ ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් 05%ක දේපළ බද්ද, වාර්ෂිකව මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වැනි දිනයන්හි කාර්තු මුදල ගෙවිය යුතු ය.

වාර්ෂික දේපළ බද්ද එකවර ජනවාරි 31 කට පෙර ගෙවන්නේනම් 10%ක වට්ටමක් හා එක් එක් කාර්තුවල බද්ද එම කාර්තුවේ පළමු මාසයේ ගෙවන්නේනම් 05%ක වට්ටමක් ගෙවනු ලැබේ. අදාළ දිනයන්හි දේපළ බද්ද ගෙවීමට අපහසුවුවහොත් පදිංචි අවශ්‍යතාවයට පරිහරණය කරනු ලබන දේපළවලටත් හිස් ඉඩම්වලටත් 10%ක් හා පදිංචි අවශ්‍යතාවයන්ට හැර වෙනත් අවශ්‍යතාවයන්ට පරිහරණය කරන දේපළවලට 15%ක දඩ මුදල් අයකරනු ලැබේ.

මේරි ක්‍රිෂ්ටිනා සසිදරන්,
සභාපති,
මන්මුනේ ප්‍රාදේශීය සභාව,

2010 දෙසැම්බර් මස 02 වැනි දින.
ප්‍රාදේශීය සභා කාර්යාලය,
ආරයම්පදි.

08-343/1

### මන්මුණේ ප්‍රාදේශීය සභාව

සංවර්ධනය වූ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

1987 වර්ෂයේ ප්‍රාදේශීය සභා ආඥාපනතේ අංක 15හි 134(1)(2) වගන්ති යටතේ මන්මුණේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පහත සඳහන් ගම්මාන සංවර්ධන වූ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර එකී රේඛා චිත්‍ර මේ සමග අමුණා එවනු ලැබේ.

| *ඉඩම් කැබලි අංක* | *ගම්මානය* | *ග්‍රාම නිලධාරි වසමේ අංකය* |
|---|---|---|
| 5 | ආරයම්පදි නැගෙනහිර | 157C |
| 6 | සෙල්වානගර් නැගෙනහිර | 157B |
| 7 | සෙල්වානගර් | 157A |
| 14 | කෝවිල්කුලම් | 156C |
| 15 | පාලමුනේ | 152 |
| 16 | වේඩර්කුඩිරුප්පු | 153B |
| 17 | තාලංකුඩා | 153 |
| 18 | ඔල්ලිකුලම් | 155A |
| 19 | මාවිලංගුතුරයි | 154 |
| 20 | මන්මුණේ | 153A |
| 21 | පුදුකුඩිරුප්පු උතුර | 151B |
| 22 | පුදුකුඩිරුප්පු | 151 |
| 23 | පුදුකුඩිරුප්පු දකුණ | 151A |
| 24 | කිරාන්කුලම් උතුර | 150 |
| 25 | කිරාන්කුලම් මධ්‍යම | 150C |
| 26 | කිරාන්කුලම් | 150B |
| 27 | කිරාන්කුලම් දකුණ | 150A |

එස්. මේරි ක්‍රිස්ටිනා සසිදරන්,
සභාපති,

මන්මුණේ ප්‍රාදේශීය සභාව,
ආරයම්පදි.

08-343/2

---

### යටිනුවර ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන අයවලුන් විසින් 2011 වර්ෂයට එම උපලේඛනයේ දක්වා ඇති ස්ථානවල එළ ගවමස් වෙළඳසැල් පවත්වාගෙන යාම පිණිස බලපත්‍ර ලබාදෙන ලෙස ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව එකී උපලේඛනයේ නම් සඳහන් අයවලුන්ට බදු දීම ගැන යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඒසේ විරුද්ධවීමට හේතුව සඳහන් කර ලියවිල්ලක් පිටපත් 02 කින් යුක්තව මෙය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) යටතේ මෙයින් දැනුම් දෙමි.

බලයලත් නිලධාරි,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

ප්‍රාදේශීය සභාව,
ඇඹිල්මීගම,
පිළිමතලාව.
2011 ජූලි මස 26 වැනි දින,

| | *ඉල්ලුම්කරුගේ නම* | *ලිපිනය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 01. | බී අමර්දීන් මයා | අංක 38, පේරගොල්ල, මුරුතලාවත්ත, මුරුතලාව | එළගවමස් වෙළඳාම |
| 02. | ඒ. එම්. එම්. සීදු මයා | අංක 1/100, අමුකොටුව, මුරුතලාව | එළ ගවමස් වෙළඳාම |
| 03. | එම්. අයි. එම්. නියාස් මයා | අංක 37ඒ/1, යහලතැන්න | එළ ගවමස් වෙළඳාම |
| 04. | ටී. එස්. අබ්දුල් රහීම් | අංක 05, මුංවතුගොඩ, දන්තුරේ | එළ ගවමස් වෙළඳාම |
| 05. | ඒ. එම්. එස්. හමීඩ් මයා | දෙහි අංග පල්ලිය අසල, මුරුතලාව | එළ ගවමස් වෙළඳාම |
| 06. | ටී. එම්. මහරුෆ් මයා | අංක 144, යහලතැන්න | එළ ගවමස් වෙළඳාම |

08-346

**රත්තොට ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය සභාව මගින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් රත්තොට ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශව විසින් යම් විරෝධතාවයක් පළකර සිටින්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

2011 මැයි මස 30 වැනි දින මහ සභාවේ අංක 04.04.04 ඡේදය යටතේ මෙය සම්මත කර ඇති බව ද නිවේදනය කරනු ලැබේ.

ටී. ඩී. ජයතිස්ස,
සභාපති,
රත්තොට ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 26 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය සභාවේ දී ය.

**රත්තොට ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස ප්‍රකාශයට පත් කරන මාර්ග පිළිබඳ උපලේඛනය**

| *අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *පාරේ පටන් ගැන්ම* | *මාර්ගයේ දිග පළල* | *මායිම්* | |
|---|---|---|---|---|---|---|
| | | | | | *වමට* | *දකුණට* |
| 01. | මැදවේරගම ඊරියගොල්ල ජනපද පාර | මැදවේරගම | පිහිළිඇළ මාර්ගයේ නිශ්ශංක දිසානායක මහතාගේ ඉඩම අසලින් | මී.200-අඩි 15 | 1. නිශ්ශංක දිසානායක ඉඩම, (5920)<br>2. ඩී. කෝරලේ ගෙදර ඉඩම, ඔප්පු අංක 527<br>3. එච්.එම්. ජයසේම බණ්ඩාගේ ඉඩම<br>4. සමුද්‍රා ඒකනායකගේ ඉඩම<br>5. එම්. අනුලාවතීගේ ඉඩම<br>6. එච්. එම්. අබේරත්නගේ ඉඩම<br>7. පී. ආර්. වීරසේකරගේ ඉඩම | 1. වී. පී. හේරත් බංඩාගේ ඉඩම<br>2. ඩබ්. කේ. කෝරලේගෙදර ඉඩම<br>3. ඩී. එම්. විමලධර්ම බණ්ඩාගේ ඉඩම<br>4. ඩී. එම්. අනුලාවතීගේ ඉඩම<br>5. කේ. ජී. දයානන්ද කෝරලේගෙදර ඉඩම<br>6. පී. ආර්. වීරසේකර ඉඩම, (අංක 13)<br>7. අමරතුංග ඉඩම |
| 02 | ගොඩකුඹුරවත්ත පාර | කුරුවාව | රත්තොට අළකොළමඩ ප්‍රධාන මාර්ගය ගනේතැන්න | මී.35-අඩි 12 | 1. බී. ජී. ගුණසේකර මහතාගේ ඉඩම | 1. එච්. සනී ද සිල්වා මහතාගේ ඉඩම |

08-358

# විවිධ දැන්වීම්

**නිකවැරටිය ප්‍රාදේශීය සභාව**

දැන්වීම් ප්‍රදර්ශනය සඳහා බලපත්‍ර ගාස්තු

ස්ථිර දැන්වීමක් සඳහා ලිත් වර්ෂයකට - වර්ග අඩියකට රු. 60 0
ස්ථිර දැන්වීමක් සඳහා හය මාසයකට - වර්ග අඩියකට රු. 30 0
තාවකාලික බැනරයක් සඳහා මාසයකට වැඩි - වර්ග අඩියකට රු. 25 0
තාවකාලික බැනරයක් සඳහා මාසයකට වැඩි - වර්ග අඩියකට රු. 20 0
තාවකාලික බැනරයක් සඳහා මාසයකට අඩු - වර්ග අඩියකට රු. 15 0

කිසියම් බැම්මක, බිත්තියක ප්‍රදර්ශනය වන දැන්වීමක් හා කිසියම් වීදියක පාරට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලෙහි මුහුණතෙහි හෝ වෙළඳ ශාලා නාමපුවරු හෝ ගොඩනැගිල්ලෙහි මුහුණතෙහි සීමාව ඉක්මවා යන ප්‍රචාරක දැන්වීමක් හෝ මෙයට ඇතුළත් ය.

එස්. ඒ. ශ්‍රියානන්ද,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

08-350/7

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා විනෝද බද්ද

267 වැනි අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ 02 වැනි උපවගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත ප්‍රදේශයන්හි පැවැත්වෙන (ආඥා පනතේ විස්තර කර ඇති) විනෝද කටයුතු සඳහා, ප්‍රවේශ පත්‍ර ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් 2011 වර්ෂය සඳහා ගෙවිය යුතුයි.

**(176 වන අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු**

| *ආසන සංඛ්‍යාව* | *එක් දිනකට* | *දින 07ක් හෝ ඊට අඩු* | *මාසයකට හෝ ඉන් කොටසකට* | *දෙසැම්බර් මස 31න් අවසන් වන වර්ෂයකට* |
|---|---|---|---|---|
| | *(රු.)* | *(රු.)* | *(රු.)* | *(රු.)* |
| 100ට වැඩි නොවන විට | 15 | 25 | 50 | 15 |
| 200 සිට 399 දක්වා | 25 | 35 | 15 | 15 |
| 400 සිට 499 දක්වා | 35 | 50 | 15 | 15 |
| 500ට වැඩි | 150 | 250 | 15 | 15 |

සංගීත සංදර්ශනයක් සඳහා දිනකට - රු. 2,000 0

එස්. ඒ. ශ්‍රියානන්ද,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

08-350/8

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අනුව ඉඩම් බෙදා වෙන් කිරීමේ සැලසුම අනුමත කිරීම

අනු බෙදුම් ගාස්තු :-

| | රු. |
|---|---|
| 01. 1 බිම් කොටසක් සඳහා | 1,000 0 |
| 02. 1ට වැඩි වන බිම් කොටසක් සඳහාම | 500 0 |

මෙම බදු මුදල සඳහා රජය විසින් පනවනු ලබන වැට් මුදල හා වෙනත් බදු ගෙවිය යුතු වේ.

එස්. ඒ. ශ්‍රියානන්ද,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

08-350/2

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සඳහන් සේවාවන් සඳහා 2011.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කළ යුතුවේ :-

| | | |
|---|---|---|
| 01. | වරිපනම් ලේඛනය සංශෝධනය කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 50 0 |
| 02. | වීථිරේඛා (නොපවරා ගැනීමේ ) සහතික ගාස්තුව | 500 0 |
| 03. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 500 0 |
| 04. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා පරීක්ෂණ ගාස්තු | 250 0 |
| 05. | ගොඩනැගිලි සැලසුම මත අනුමත කාලය දීර්ඝ කර ගැනීම | 100 0 |
| 06. | අනුකූලතා සහතිකය සඳහා ගාස්තු - නිවාස සඳහා | 500 0 |
| | ව්‍යාපාර සඳහා | 750 0 |
| 07. | පෙරසැරි ගාස්තු - නිවාස සඳහා වර්ග අඩි 2000ට | 500 0 |
| | වැඩි වන සෑම වර්ග අඩි100ක් සඳහා | 100 0 |
| 08. | පෙරසැරි ගාස්තු - ව්‍යාපාර සඳහා වර්ග අඩියකට | 750 0 |
| | වැඩි වන සෑම වර්ග අඩි100ක් සඳහා | 200 0 |
| 09. | ජලය බවුසරයක් සඳහා | 850 0 |
| | ප්‍රවාහනය සඳහා කි. මී. 1ක් සඳහා | 65 0 |
| 10. | තාවකාලික වෙළඳ කුටියක් සඳහා - එක් දිනකට වර්ග අඩියකට | 3 0 |
| | තාවකාලික වෙළඳ කුටියක් සඳහා - දින 1 සිට 7 දක්වා වර්ග අඩියකට | 2 0 |
| | තාවකාලික වෙළඳ කුටියක් සඳහා - දින 7ට වැඩි වන විට වර්ග අඩියකට | 1 0 |
| 11. | ප්‍රාදේශීය සභා ක්‍රීඩා භූමිය, සතිපොල භූමිය, පරණ බස් නැවතුම්පොල භූමිය කුලිය දීම - දිනකට | 2,000 0 |
| | වැඩිවන සෑම එක් දිනකට | 500 0 |
| 12. | කොඩි කණුවක් කුලියට දීම | 20 0 |
| | පුටු එකක් කුලියට දීම | 10 0 |
| | කොඩි කුලියට දීම | 10 0 |

| | | |
|---|---|---|
| 13. | කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුලියට දීම : | රු. |
| | සභාව සතු ඉදිකිරීම් සඳහා දිනකට | 2,000 0 |
| | පෞද්ගලික ඉදිකිරීම් සඳහා දිනකට | 3,000 0 |
| 14. | ට්‍රැක්ටරයක් ට්‍රේලරයක් දිනකට කුලියට දීම | 3,000 0 |

එස්. ඒ. ශ්‍රියානන්ද,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

08-350/3

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### වාහන නැවතුම් ස්ථාන පාලනය කිරීමේ හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව මත ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වැනි වගන්තිය ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභාව මඟින් සම්මත කරන ලද වාහන නැවතුම් ස්ථාන විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීමේ අතුරු ව්‍යවස්ථාව අනුව, 2011 වර්ෂය සඳහා උපලේඛනයේ සඳහන් ආකාරයට ගාස්තු ගැසට් නිවේදනයක් මඟින් දැනුම් දීමකින් අවලංගු කරන තෙක්, 2011.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පනවා අයකිරීමට නිකවැරටිය ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම ගාස්තුව සෑම වසරකම මාර්තු 31 දිනට හෝ ඊට පෙර ගෙවිය යුතුය.

| | | රු. ශත |
|---|---|---|
| 1. | ලොරි රථයක් සඳහා | 750 0 |
| 2. | වෑන් රථයක් සඳහා | 750 0 |
| 3. | ට්‍රැක්ටර් ට්‍රේලරයක් සඳහා | 300 0 |
| 4. | ත්‍රීවීල් රථයක් සඳහා | 300 0 |
| 5. | මෝටර් කාරයක් සඳහා | 350 0 |
| 6. | අත් ට්‍රැක්ටරයක් සඳහා | 200 0 |

එස්. ඒ. ශ්‍රියානන්ද,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

08-350/6

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149, 150(1), 150(2), 151, 152(1), 152(2), 153(1), 154(1) වැනි වගන්ති ප්‍රකාර, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනවලින් දක්වා ඇති පරිදි ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක් ද, ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ වෙළඳ ව්‍යාපාරයේ පිරිවැටුම මත පැනවූ වාර්ෂික බද්දක් ද, 2011 වර්ෂය සඳහා බලපවත්වන පරිදි පනවා අය කිරීමට 2010.11.26 වැනි දින පැවති නිකවැරටිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 10 - 11 යටතේ සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ඒ. ශ්‍රියානන්ද,
සභාපති,
නිකවැරටිය,
ප්‍රාදේශීය සභාව.

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

**1 වැනි උපලේඛනය**

***බලපත්‍ර ගාස්තු - 149 වැනි වගන්තිය***

| | *බලපත්‍රයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු.* | *වාර්ෂික වටිනාකම රු. 750 - රු. 1,500 දක්වා රු.* | *වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු.* |
|---|---|---|---|---|
| | *අප්‍රසන්න හා සෞඛ්‍ය ආරක්ෂිත කර්මාන්ත (අන්තරාදායක)* | | | |
| 01. | තේ කඩයක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 02. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 | 600 | 750 |
| 03. | ආපනශාලාවක් පවත්වාගෙන යාම | 500 | 600 | 1,000 |
| 04. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 | 600 | 1,000 |
| 05. | ලී මෝලක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |

| | *බලපත්‍රයේ ස්වභාවය* | *වාර්ෂික වට්නාකම රු. 750 ට අඩු රු.* | *වාර්ෂික වට්නාකම රු. 750 - රු. 1,500 දක්වා රු.* | *වාර්ෂික වට්නාකම රු. 1,500ට වැඩි රු.* |
|---|---|---|---|---|
| 06. | ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 500 | 600 | 750 |
| 07. | කළුගල් කැඩීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 08. | කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 | 600 | 800 |
| 09. | කුකුළුමස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 | 600 | 800 |
| 10. | මස් වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 | 800 | 1,000 |
| 11. | වඩුමඩුවක් හා යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 12. | කෘෂි රසායනික ද්‍රව්‍ය වෙළඳාම | 400 | 600 | 800 |
| 13. | බැටරි චාජ් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 500 | 700 |
| 14. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 15. | වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 16. | බේකරියක් පවත්වාගෙන යාම | 500 | 600 | 750 |
| 18. | රසකැවිලි නිෂ්පාදනය හා අලෙවි කිරීම | 300 | 400 | 500 |
| 19. | ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 20. | යෝගට් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 600 | 800 |
| 21. | එළකිරි හෝ මීකිරි නිෂ්පාදන ආයතන පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 22. | සාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 | 700 | 1,000 |
| 23. | තෙල් මෝලක් පවත්වාගෙන යාම | 400 | 600 | 1,000 |
| 24. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 25. | ඔසුපැන් අලෙවි හලක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 26. | බිම්මල් නිෂ්පාදනය හා අලෙවිය | 350 | 450 | 550 |
| 27. | මල් ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 700 | 1,000 |
| 28. | කිරි එකතු කිරීමේ ස්ථානයක් | 400 | 600 | 800 |
| 29. | කුළුබඩු හා වියලි ආහාර ඇසුරුම් කිරීම හා වෙළඳාම | 400 | 600 | 800 |
| 30. | කම්මලක් පවත්වාගෙනයාම | 400 | 500 | 600 |
| 31. | මධ්‍යසාර අඩංගු නොවන බීම නිෂ්පාදන හලක් සඳහා | 500 | 700 | 1,000 |
| 32. | ෆයිබර් ග්ලාස් ආශ්‍රිත නිෂ්පාදන සඳහා | 600 | 800 | 1,000 |
| 33. | සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 34. | දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම | 600 | 800 | 1,000 |
| 35. | සීත කරන හා වායු සමීකරණ අළුත්වැඩියා කරන ස්ථාන සඳහා | 500 | 600 | 800 |
| 36. | සම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500 | 600 | 800 |
| 37. | වීදුරු අලෙවි හලක් පවත්වාගෙන යාම | 500 | 600 | 800 |
| 38. | මිරිදිය මත්ස්‍ය ගොවිපලක් පවත්වාගනෙ යාම | 500 | 600 | 700 |
| 39. | කොප්පරා නිෂ්පාදනය කිරීම සඳහා | 300 | 400 | 500 |
| 40. | පුපුරන ද්‍රව්‍ය වෙළඳාම සඳහා | 600 | 800 | 1,000 |
| 41. | වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 600 | 800 | 1,000 |
| 42. | රටබීම හලක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 43. | සත්ව ආහාර නිශ්පාදනය හා අලෙවිය | 400 | 500 | 600 |
| 44. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 400 | 600 | 700 |
| 45. | විදුලි කාර්මික සේවය | 400 | 600 | 800 |
| 46. | වඩේ, මුරුක්කු, කඩල නිෂ්පාදන හා අලෙවිය | 250 | 300 | 400 |
| 47. | ගඩොල් නිෂ්පාදනය හා පිළිස්සීම | 500 | 700 | 1,000 |
| 48. | දෙහි ආශ්‍රිත නිෂ්පාදන | 300 | 500 | 600 |
| 49. | කරවල අලෙවි කිරීම | 400 | 500 | 600 |
| 50. | ශීත කළ හෝ ශීත නොකළ මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 | 800 | 1,000 |
| 51. | සබන් නිෂ්පාදනය | 250 | 350 | 450 |
| 52. | පානීය ජලය නිෂ්පාදනය කිරීම | 600 | 800 | 1,000 |
| 53. | විදුලි භාණ්ඩ අළුත්වැඩියාව | 400 | 500 | 600 |
| 53. | පොල්කටු අඟුරු නිෂ්පාදනය | 300 | 400 | 600 |
| 54. | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 400 | 600 | 800 |
| 55. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 | 600 | 800 |
| 56. | සංචාරක මාළු වෙළඳාම | 400 | 500 | 600 |
| 57. | ලැගුම් හලක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 58. | බත් පාර්සල් කර අලෙවි කිරීම | 300 | 400 | 500 |
| 59. | සී. ඩී. හා කැසට් පට අලෙවි කිරීම | 400 | 500 | 600 |
| 60. | රසායනික පොහොර ගබඩා කිරීම හා විකිණීම | 500 | 600 | 800 |

| | බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත | වාර්ෂික වටිනාකම රු. 750 - රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 61. | ධාන්‍ය වර්ග පිටිකර විකිණීම | 300 | 400 | 500 |
| 62. | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය | 400 | 500 | 600 |
| 63. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අළුත්වැඩියාව | 400 | 500 | 600 |
| 64. | පාපැදි අළුත්වැඩියාව | 200 | 300 | 400 |
| 65. | යතුරු පැදි අළුත්වැඩියාව | 400 | 600 | 800 |
| 66. | රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 67. | මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම | 500 | 600 | 800 |
| 68. | ඌරු කොටුවක් පවත්වාගෙන යාම (ඌරන් 10ට වැඩි) | 400 | 500 | 600 |
| 69. | එළු කොටුවක් පවත්වාගෙන යාම (එළුවන් 10ට වැඩි) | 400 | 500 | 600 |
| 70. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 71. | අයිස්ක්‍රීම් අලෙවිය | 500 | 600 | 800 |
| 72. | සමාජ ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 600 | 800 |
| 73. | පපඩම් නිෂ්පාදන | 400 | 500 | 600 |
| 74. | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම | 300 | 400 | 500 |
| 75. | රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 76. | ගෑස් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 600 | 700 |

## දෙවැනි උපලේඛනය

### *ව්‍යාපාර සම්බන්ධ බදු*

| | | | | |
|---|---|---|---|---|
| 01. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 02. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 300 | 400 | 600 |
| 03. | තොග බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 | 700 | 1,000 |
| 04. | ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කිරීමේ (ෆාමසියක්) පවත්වාගෙන යාම | 500 | 700 | 1,000 |
| 05. | සිංහල බෙහෙත් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 400 | 600 |
| 06. | විදුලි භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 07. | විසිතුරු බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 08. | පළතුරු වෙළඳාම | 300 | 400 | 600 |
| 09. | ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 10. | දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 11. | රෙදිපිළි හා නිමි ඇඳුම් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 600 | 800 |
| 12. | ඇස් කණ්නාඩි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 13. | පොත් සාප්පු හා ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 14. | ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 700 |
| 15. | පැරණි භාණ්ඩ මිළදී ගැනීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 500 | 700 |
| 16. | රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 17. | දුරකථන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 600 | 800 |
| 18. | බුලත් පුවක් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 19. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 20. | තීන්ත අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 21. | ධාන්‍ය මිළදී ගැනීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 600 | 800 |
| 22. | ඇළුමිනියම් හා බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 350 | 400 | 500 |
| 23. | වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 24. | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 25. | දුරකථන හා ෆොටෝකොපි සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 26. | පාවහන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 27. | සුරතල් මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 28. | ජුවලරියක් පවත්වාගෙන යාම | 500 | 600 | 700 |
| 29. | වාහන අමතර කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 30. | ගොඩනැගිලි ද්‍රව්‍ය උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 31. | පරිගණක අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |

| | බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත | වාර්ෂික වටිනාකම රු. 750 - රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 32. | වීදුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 33. | තිරිඟු පිටි අලෙවිසැලක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 34. | ටයර් ටියුබ් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 35. | ඇඟළුම් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 36. | එළවළු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 37. | ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 38. | මෝටර් සයිකල් අමතර කොටස් අලෙවි කිරීම | 400 | 600 | 800 |
| 39. | ගුවන් විදුලි, රූපවාහිනී අමතර කොටස් අලෙවි කිරීම | 400 | 500 | 600 |
| 40. | ඇලුමිනියම් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 41. | පිත්තල භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 42. | තොග වශයෙන් සිගරට් බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 43. | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 44. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 45. | ඉංග්‍රීසි වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 800 | 1,000 |
| 46. | මෝටර් සයිකල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 47. | ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 48. | සෙල්ලම් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 49. | රේස් බුකියක් පවත්වාගෙන යාම | 400 | 800 | 1,000 |
| 50. | පැල වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 |
| 51. | ඛනිජ තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |
| 52. | ප්ලාස්ටික් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 600 | 800 |
| 53. | සමුපකාර අලෙවි සැලක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 |
| 54. | සූර්යකෝෂ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 | 800 | 1,000 |

## තුන්වැනි උපලේඛනය

*152(1) වැනි වගන්තිය යටතේ බදු පැනවීම*

මෙම බද්ද ගෙවිය යුතු වර්ෂයට, පෙර වර්ෂයේ ලැබීම්වලට අනුකූලව පහත දැක්වෙන ප්‍රමාණයන් නොඉක්මවන පරිදි වේ.

| | *පෙර වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලැබීම්* | *ගෙවිය යුතු වාර්ෂික බද්ද රු.ශ.* |
|---|---|---|
| (1) | රු. 1 සිට 6,000 දක්වා | 0 |
| (2) | රු. 6,001 සිට රු. 12,000 දක්වා | 90 0 |
| (3) | රු. 12,001 සිට රු. 18,750 දක්වා | 180 0 |
| (4) | රු. 18,751 සිට රු. 75,000 දක්වා | 360 0 |
| (5) | රු. 75,001 සිට රු. 1,50,000 දක්වා | 1,200 0 |
| (6) | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

*මෙම බදු අදාළ වන්නේ :*

01. කොමිස් ඒජන්තවරයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
02. බ්‍රෝකර්වරයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
03. වෙන්දේසිකරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
04. මුදල් ණයට දෙන්නෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
05. කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
06. උගස් බඩු ගන්නා අයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
07. ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
08. සැපයුම්කරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
09. රක්ෂණ නියෝජිතයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
10. ප්‍රවාහන නියෝජිතයකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
11. පුද්ගලික අධ්‍යාපන පන්ති පවත්වන්නකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
12. පුද්ගලික බස්රථ ධාවකයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
13. බැංකුකරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

14. සිනමාශාලා අයිතිකරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
15. රක්ෂණ සමාගම්කරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
16. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
17. පෞද්ගලික මිනින්දෝරුවකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
18. රැකියා ඒජන්තවරයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
19. රියදුරු පුහුණු කරවන්නකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
20. වාහන වෙළඳාම් කරන්නකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
21. ඉන්ධන පිරවුම්හල් නියෝජිතයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
22. ස්විප් ටිකට් දිස්ත්‍රික් අලෙවි නියෝජිතයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
23. රේස් ඔට්ටුපලක් පවත්වාගෙන යන්නකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
24. ඇගළුම් කම්හලක් ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
25. රටබීම වෙළඳසැලක් (අරක්කු) පවත්වාගෙන යන්නකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

08-350/1

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් වාහන සහ සතුන් පිළිබඳ බද්දක් 2011 වර්ෂය සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා අයකිරීමට තීරණය කර ඇති බව එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙන අතර, 148(3) වැනි වගන්තිය යටතේ මෙම බදු මුදල 2011.0.3.31 වැනි දිනට පෙර ගෙවිය යුතුය.

**උපලේඛනය**

| | රු. ශ. |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ ; | |
| *(අ)* වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 43 0 |
| *(ආ)* වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 50 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 00 |
| සෑම අශ්වයකු හෝ පෝනියකු සඳහා | 15 0 |
| සෑම අලියෙකු ඇතෙකු සඳහා | 50 0 |

එස් ඒ. ශ්‍රීයානන්ද,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

08-350/9

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.